# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,476- 2006 දෙසැම්බර් 15 වැනි සිකුරාදා - 2006.12.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1040 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1040 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 1040 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 1044 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.* —ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත කෙටුම්පත 2006 නොවැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 දෙසැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 371

ජාතික ශිෂ්‍යභට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2004 සැප්තැම්බර් මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් නිලයට :

ලුතිනන් ඩීඒඩී වානගුරු ;
ලුතිනන් එම්කේජීඑස් ඥාණතිලක (ගැ);
ලුතිනන් කේජී කාන්ති (ගැ).

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ දී ය.

12-565

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 372

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, පී. ඒ. මුතුකුමාරණ මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වශයෙන්.

12-596/2

2006 අංක 373

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ඩබ්ලිව්. රූබසිංහ මහතා 2006 ජනවාරි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

12-595

2006 අංක 374

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ජේ. එම්. මංගලතිස්ස මහතා 2006 පෙබරවාරි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතනික හා මානව සම්පත් සංවර්ධන) වශයෙන්.

12-596/1

# ආණ්ඩුවේ නිවේදන

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනතේ අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත් වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්ලිව්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2006 නොවැම්බර් මස 27 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01)<br>40418 | ලූෂන් එල්මෝ කොට්ලීන් මයා,,<br>අංක 49, දොලොස්බාගේ පාර,<br>දුම්රිය නිවාස,<br>නාවලපිටිය. | බෙනරගම විදානලාගේ දොන් ධර්මසේන මයා,<br>අංක 7/3, බෙනඩික්ට් පටුමග,<br>බව්වාගම,<br>නාවලපිටිය. |
| (02)<br>40424 | හේවායලාගේ සීතා රාජරත්න මිය,,<br>අංක 1/18, ජනරජ මාවත,<br>අලව්ව | ඉරසිංහ අච්චිල්ලාගේ ගුණවතී මැණිකේ මිය.,<br>"නව ඉසුරු",<br>නාරම්මල පාර, අලව්ව. |
| (03)<br>40091 | 1. දෙමල පල්ලියෙ ගුරුන්නාන්සේලාගේ ආතර් ඉග්නේෂන් ප්‍රනාන්දු මයා,,<br>අංක 01, ලෙස්ලි පෙරේරා මාවත,<br>කළුතර උතුර,<br>කළුතර.<br><br>2. දෙමල පල්ලියෙ ගුරුන්නාන්සේලාගේ මෝසස්, ඇන්ඩෲ ප්‍රනාන්දු මයා.,<br>මයුර පෙදෙස, මහ හීනටියන්ගල,<br>කළුතර දකුණ.<br><br>3. දෙමල පල්ලියෙ ගුරුන්නාන්සේලාගේ තියොඩර් ඔලිවර් ප්‍රනාන්දු මයා.,<br>කාරියවත්ත, ජනතා මාවත,<br>කුඩා පයාගල, පයාගල. | පයාගල වඩුගේ ඔසිලියා ක්ලැඩිබර් ප්‍රනාන්දු මයා.,<br>අංක 11, කුරේ පාර, කටුකුරුන්ද,<br>දකුණු කළුතර. |

12-478

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වැනි වගන්තිය යටතේ නිවේදනය

110 වැනි අධිකාරය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මම 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8146 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය එහි මධ්‍යම පළාත, මාතලේ දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ ;

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත :

* වගපනහ පල්ලේසිය පත්තුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 08 දරන විෂය වෙනුවට මෙහි වූ “අ” උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද,

* වගපනහ පල්ලේසිය පත්තුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 08 දරන විෂයට ඉක්බිතිව මෙහි වූ “ආ” දරන අළුත් විෂය ඇතුළත් කිරීමෙන්.

2006.1 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2006ක් වූ නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

මාතලේ දිස්ත්‍රික්කය

*දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*‘අ’ උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත වගපනහ පල්ලේසියපත්තුව උප්පැන්න හා ම රණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය

හතලිහ කණුව
අඟුණවැල්පැලැස්ස
ඇඹුල්අඹේ
ඇටඹුල
ඇතාබැඳිවැව
අටුබැඳියාව
බණ්ඩාරයාය
බිංතැඹුර
බොරලුකන්ද
දෙමටගස්පිටිය
ගල්ලෙනවත්ත
හුඹස්ගමුව
ඉඳිගොල්ලෑව
ඉහළ ඇරැවුල අලුත්ගම
ඉහළ ඇරැවුල පරණගම
ජනකම්ණිපුරගම
ජය මාවත
කලෝගහඇල අලුත්ගම
කලෝගහඇල පරණගම
කලුන්දැව අලුත්ගම
කලුන්දැව පරණගම
කණ්ඩලම පාර- දකුණ
කඳුබඩයාය
කපුවත්ත
කිරලගොල්ල
කිරලැස්ස
කිරිවැල්මූකලාන
කෝන්ගහපිටිය
කොට්ටවෙල
කුඩාගෝනවැව
කුඹුක්කඳන්වල
ලෙනදොර
ලෙනදොර 38 කණුව
ලේනව
මහයාය
මාලිගාතැන්න
මැණික්දෙන
මොරගොල්ලෑව
මූකලාන (ලෙනදොර)
නයාකුඹුර
නිග්ගොල්ලයාය
පහළ ඇරැවුල
පන්නම්පිටිය
පුවක්අත්තාවල
රත්මලගහඇල
සීගිරිමුල්ල
සියඹලාවැව
සුමංගලපුර
තිත්තවැල්ගොල්ල
උණපඳුරුයාය
වල්ගහපුයාය
වල්ගම්වැව
වත්තේගම්මැද්ද
වවුල්අඹේ
වැලම්ටියාව
වෙලංගස්මාන
වෙලංගොල්ල
වැවලවැව
යක්කුරාගල උතුර
යක්කුරාගල දකුණ
යාපාගම

*‘ආ’ උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත දඹුල්ල නගරය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය :

විසිනවය කණ්ඩලම (විල්හත)

අතුපාරයාය
බටුයාය
බුලාගල
කැප්ඇල
දඹුල්ල නව නගරය
දඹුල්ල නගරය
දඹුලුගම
දෙමදඹය ජනපදය
එඬේරගල කොටස (වැලිහේන)
ගල්වැටියාය
හලුඅපුල්ලනවැව
හීංමොරගොල්ල
කණ්ඩලම
කණ්ඩලම පාර(අතුපාරයාය)
කණ්ඩලම පාර වම(පහළවැව)
මිරිස්ගොනියාව
නාවාගස්හින්න
පහළ දාසය කොටස( විල්හත)
පහළවැව
පල්ලේගම
පල්ලේගම ජනපදය
පැල්වැහැර
පැල්වැහැර ගොවිපල
පොහොරන්වැව
සම්පත්වත්ත
සේරුගස්යාය
සිසිරවත්තගම
තුඹකරවිලගම
වැලිහේන
වැලියායගම.

12-541

---

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2)(අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ළමා නිවාසය එකී වගන්තියෙහි කාර්යය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"පෙරිස්ටෙරා ළමා නිවාසය"

12-591

## 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 31 (7)(අ) වගන්තිය යටතේ නියමය

2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 31 (7)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් සංවිධානය එකී වගන්තියෙහි කාර්යය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යා.*

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"හේමාස් සුනාමි පදනමේ දුප්පත් ළමුන් සඳහා පෙර පාසැල් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය"

12-593

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - අම්බලන්ගොඩ (035)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී දරන වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 **D**) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.07 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. එම්. පීරිස් විසින් සහතික කරන ලද 1996.03.12 අංක 275 දරන උකස්ප්‍රකාර ගෙවීම, හෙන්දහේවා සමන් චන්ද්‍රසිරි ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාර ලක්ෂ විසිපන්දහසක (රු. 4,25,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 1999.08.01 දින සිට වර්ෂයට 29% බැගින් රුපියල් හාරලක්ෂ විසිපන්දහසක (රු. 4,25,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසිපන්දහසක (රු. 4,25,000) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 275 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, තිරාණගම පිහිටි තිරාණගම පැලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ටී. ද එස්. මනුකුලසූරිය විසින් 1995.04.30 දින මැන සාදන ලද අංක 1108 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක ඒ කොටසට මායිම්, උතුරට : ළිඳබොඩවත්ත හෙවත් මුදුබොඩවත්ත සඳහා වෙන්කළ කැබලි අංක 01 ද, නැගෙනහිරට : ගාල්ල කොළඹ ප්‍රධාන පාර ද, දකුණට : මෙම ඉඩමේම කැබලි අංක අංක 04 ද සහ බටහිරට : මුහුදු වෙරළ ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුනයි දශම තුනක් විශාල (අක්කර 0, රූඩ් 1, පර්චස් 3.3) ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ඇතුළු සියලු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක සී 678/102 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

12-583

---

එන් (පීවීඑස්) 15903.

### 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ කුමාර එන්ටර්ප්‍රයිසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1995.09.27 දින සංස්ථාපිත සමාගමක් වන කුමාර එන්ටර්ප්‍රයිසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කුමාර එන්ටර්ප්‍රයිසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

12-424

---

එන් (පීවීඑස්) 24668.

### 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ඩයමන්ඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.10.01 දින සංස්ථාපිත සමාගමක් වන ඩයමන්ඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඩයමන්ඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

12-423

එන් (පීවීඑස්) 21495.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ අරුණ පේපර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.06.24 දින සංස්ථාපිත සමාගමක් වන අරුණ පේපර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අරුණ පේපර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

12-422

---

එන් (පීවීඑස්) 28449.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ඩොලර්ස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2001.05.22 දින සංස්ථාපිත සමාගමක් වන ඩොලර්ස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට,ඩොලර්ස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

12-425

---

එන් (පීවීඑස්) 23477.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ක්‍රිස්ටල් ග්‍රැනයිට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.04.19 දින සංස්ථාපිත සමාගමක් වන ක්‍රිස්ටල් ග්‍රැනයිට් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ක්‍රිස්ටල් ග්‍රැනයිට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

12-421

---

එන් (පීවීඑස්) 20405.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ නයින්හාර්ට්ස් ස්ක්‍රීන් ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.01.02 දින සංස්ථාපිත සමාගමක් වන නයින්හාර්ට්ස් ස්ක්‍රීන් ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, නයින්හාර්ට්ස් ස්ක්‍රීන් ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

12-431

එන් (පීවීඑස්) 22526.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ලෝගොස් ප්‍රින්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.11.18 දින සංස්ථාපිත සමාගමක් වන ලෝගොස් ප්‍රින්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලෝගොස් ප්‍රින්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

12-426

---

## වයඹ සංවර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002 දෙසැම්බර් මස 18 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ඒ. බංඩාර විසින් සහතික කරන ලද 1999 මැයි මස 20 වැනි දින අංක 4058 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බණ්ඩාර කොස්වත්ත, මඩිගම්දියාල, උගුරුස්සාගම හාල්මෝල හි පදිංචි අබ්දුල් හමීඩ් මොහමඩ් තස්ලීම් සහ බණ්ඩාර කොස්වත්ත, මඩිගම්දියාල, උගුරුස්සාගම හාල්මෝල හි පදිංචි ඉස්මා ලෙබ්බේලාගේ මොහම්මදු සුල්තාන් ණයකරුවන් හා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් තුන් ලක්ෂ විසිඑක් දහස් එකසිය හතලිහ (රු. 3,21,140) ක මුදලද, එකී මුදලට 2002.10.29 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසි හතරක (24%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 4058 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, තිස්සව කෝරළේ මඩිගේ මිදියාල පිහිටි "මිනිපිටියේහේන" කියන ඉඩමට බලයලත් මානක ආරියදාස අතපත්තු මහතා විසින් මැන සාදන ලද අංක 88/107 සහ 1988.07.14 දින දරන පිඹුරේ එන, කැබලි අංක 1 දරන, උතුරට : දැනට මොහමඩ් ඉස්මායිල් අබ්දුල් හමීඩ්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : උගුරුස්සාගම ගමද, දකුණට : එකී පිඹුරේ කැබලි අංක 2 දරන ඉඩම ද, බස්නාහිරට : ගම්සභා පාර ද, යන මායිම් තුළ පිහිටි අක්කර එකකුත්, පර්චස් තිස්දෙක (අ. 01, රූ. 0, ප. 32) ක් විශාල ඉඩම සහ ඊට අයිති සෑම සියළු දේත් වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 972/143 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

12-420/2

---

## වයඹ සංවර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් චිත්‍රා ජයසිංහ විසින් සහතික කරන ලද 2003 අගෝස්තු මස 28 වැනි දින අංක 534 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වීරපොකුණ තැපැල්, මානෙලේමුබුව හි පදිංචි රත්න ජයතිලක මුදියන්සේලාගේ කිරිමුදියන්සේ සහ වීරපොකුණ තැපැල්, මානෙලෙම්බුව හි පදිංචි රත්න

ජයතිලක මුදියන්සේලාගේ විමලරත්න ණයකරුවන් හා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් තුන්ලක්ෂ දහසයදහස් තුන්සිය තිහක් (රු. 3,16,330) ක මුදලද, එකී මුදලට 2005.07.28 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩු කර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 534 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිනියම කෝරළේ, 410 මානෙලෙම්බුව ග්‍රාමනිළධාරී කොට්ඨාසයේ, මානෙලෙම්බුව නැමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් වි සින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 02 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 1381 දරන පිඹුරෙහි අංක 100 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 03, පර්චස් 10ක් ඇතැයි ගණන් බලා තිබෙන කොන්ගහ කැලේ යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය උතුරට : කැබලි අංක 141 ප්‍රවේශ මාර්ගය, නැගෙනහිරට : කැබලි අංක 141 ප්‍රවේශ මාර්ගය, දකුණට : කැබලි අංක 101, බටහිරට : කැබලි අංක 141 ප්‍රවේශ මාර්ගය සහ ඊට අයත් සියළු දේද වේ.

මෙම ඉඩමට අවසාන ගම් පිඹුරු අංක 1381හි 100 දරන ලොට් කැබැල්ල වෙනමම කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ වර්ෂ 2003.04.25 වන දින කුරුණෑගල මිනින්දෝරු අධිකාරී විසින් වෙනම පිටපතක් නිකුත් කර ඇත.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B/34/125 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

12-420/1

---

## වයඹ සංවර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය.

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ජූනි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. එම්. බිස්රුල් අමීන් විසින් සහතික කරන ලද 2004 ජනවාරි මස 21 වෙනි දින අංක 7989 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නවගත්තේගම, මුල්ලේගම පදිංචි අබේසිංහ හේරත් මුදියන්සේලාගේ ගාමිණී අබේසිංහ සහ නවගත්තේගම, මුල්ලේගම පදිංචි අබේසිංහ හේරත් මුදියන්සේලාගේ පුංචි බණ්ඩා ණයකරුවන් හා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් නවසියයක (රු. 2,54,900) මුදල ද, එකී මුදලට 2005.11.30 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිදෙක(22%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 7989 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිමැටියාව හත්පත්තුවේ, 645/3 මුල්ලේගම ග්‍රාම නිළධාරී වසමේ, මුල්ලේගම ග්‍රාමයේ පිහිටි අක්කර 01 ක් විශාල රජයේ ගොඩ ඉඩමට මායිම්, උතුරට : කේ. එච්. එම්. රන්මැණිකේගේ ඉඩමද; නැගෙනහිරට : ආණමඩුව සිට ගල්ගමුව දක්වා ඇති ප්‍රධාන මාර්ගයද; දකුණට : එස්. ඒ. පියරත්නට අයිති ඉඩම ද; බස්නාහිරට : රජයේ ඉඩම ද වේ. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ LDO 61/22 යටතේ ලියාපදිංචි වී ඇත. මෙම ඉඩම පී. තංගවේලු බලයලත් මානක නිළධාරී විසින් 2003.08.26 දින මැන සාදන ලද අංක 2972 දරන මානක සැලැස්මේ කට්ටි අංක 01 වශයෙන් ලකුණු කර ඇති අක්කර 01 ක් විශාලත්වයෙන් යුත් ඉඩමේ මායිම් වලට උතුරට : කේ. එම්. එම්. රණ්මැණිකාගේ ඉඩම ද, නැගෙනහිරට : ආණමඩුව සිට නවගත්තේගම ප්‍රධාන මාර්ගය ද; දකුණට : එස්. ඒ. පියරත්නට අයිති ඉඩමද බස්නාහිරට : රජයේ ඉඩම ද වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 61/22 සහ 13/119 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු - අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර, කුරුණෑගල.

12-420/3

## මහජන බැංකුව-ඕල්කොට් මාවත (275)

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D දරන වගන්තිය යටතේ යෝජනාව

2006.01.19 දින පවත්වන ලද ස්වකීය රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත පරිදි 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

හේවා කණ්ඩම්බිගේ අනුර, ගනේපොල ආරච්චිගේ කීර්ති සුමිත්‍රා, මහජන බැංකුවේ වාසියට පයාගල කන්කානමලාගේ දෝන මේරි අයිරින් පැට්‍රිෂියා ගුණරත්න විසින් ලියා සහතික කරන ලද 2001.03.19 දින හා අංක 1420 දරන උකස් බැඳුම්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අකලහැන්දි දීප්ති රම්‍යමාලා මෙන්ඩිස් විසින් ලියා සහතික කළ 2002.10.31 දින හා අංක 1440 දරන උකස් බැඳුම්කරය මත නියමිත ගෙවීම් පැහැර හැර ඇති අතර, පිළිවෙලින් එකී අංක 1420 හා 1440 දරන බැඳුම්කර මත දැන් රුපියල් හයලක්ෂ විසිනවදහස් පන්සීයක් (රු. 6,29,500) හා රුපියල් පන්ලක්ෂ පනස් හත් දහස් හැත්තෑවයි ශත අනූ නවයක් (රු. 5,57,070.99) වන මුදල මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, අංක 1420 හි 1440 දරන බැඳුම්කර මගින් එම බැංකුවට උකස් කරන ලද දේපළ හා පරිශ්‍රය, රුපියල් හයලක්ෂ විසිනව දහස් පන්සීයක් (රු. 6,29,500) වන මුදල හා රුපියල් පන්ලක්ෂ පනස්හත්දහස් හැත්තෑවයි ශත අනූ නවයක් (රු. 5,57,070.99) වන මුදල රුපියල් හයලක්ෂ විසිනව දහස් පන්සීයක් (6,29,500) වන මුදල හා රුපියල් පන්ලක්ෂ පනස් හත්දහස් හැත්තෑවයි ශත අනූනවයක් (5,57,070.99) වන මුදල සඳහා 2001.10.18 දින සිට සියයට විසිනවය (29%) 2002.04.02 දින සිට විකුණුම් දිනය දක්වා සියයට විසිහතර (24%) බැගින් තවදුරටත් පොළියද, මේ දක්වා ලැබී ඇති ගෙවීම් (යම් ගෙවීමක් වේ නම්) අඩුකොට පිරිවැය හා විකුණුමට අදාළ වෙනත් ගාස්තුද සමග අයකර ගැනීම සඳහා අර්වින් පෙරේරා කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස මෙයින් යෝජනා සම්මත කරන ලදී.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මාකොළ උතුර පිහිටි මීගහවත්ත හා කැටකැලගහවත්ත හා පුගහවත්ත, ඇටඹගහවත්ත හා පබුලුමුල්ලවත්ත සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩී. කේ. වී. පෙරේරා විසින් සාදන ලද 1981.07.04 දින සහ අංක 1367 දරන (සත්‍ය පිටපත 2000.10.19 දින නිකුත් කරන ලද) මානක පිඹුරේ 07 වන බිම් කට්ටිය ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : මෙම ඉඩමේ 6 වන බිම් කට්ටිය ද, නැගෙනහිරට : ගම්සභා පාරද, දකුණට : මෙම ඉඩමේම B දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : 8 වන බිම් කට්ටියද මායිම් වූ විශාලත්වයෙන් පර්චස් විස්සකින් යුක්ත වන බෙදා වෙන්කළ නිශ්චිත බිම් කට්ටිය ඒ මත පිහිටි සියළු දේ සමග වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 573/28 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී විශාලත්වයෙන් පර්චස් 3 යි දශම දෙකයි පහකින් යුක්ත වූ හා ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 554/75 යටතේ ලියාපදිංචි කර ඇති එකී අංක 5430 ඒ දරන පිඹුරේ විස්තර කර ඇති හයවන බිම් කට්ටිය මත හා ඒ දිගේ මාර්ග අයිතිය සහිතය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බස්නාහිර කලාපය 01.

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

12-581

---

## මහජන බැංකුව - කඩවත ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී දරන වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.07.21 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2003.11.21 දිනැති අංක 8618 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සේනාධීර පතිරගේ පතිරත්න සහ ටිකිතන්ත්‍රි මහ හාමිලාගේ මදුරාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හත්සිය අනූඅටයි ශත හැටඅට (රු. 3,46,798.68) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.01.02 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හත්සිය අනූඅටයි ශත හැටඅට (රු. 3,46,798.68) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හත්සිය අනූඅටයි ශත හැටඅට (රු. 3,46,798.68) ක මුදල අයකර ගැනීම සඳහා ගම්පහ බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් විසින් එකී අංක 8618 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෝනහේන පිහිටි හොරගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් 1995.08.18 වැනි දින මැන සකස් කළ අංක 131/95 දරන පිඹුරේ ලොට් අංක 'ඒ' දරන කොටසට මායිම් උතුරට : එස්. පී. ජයරත්නට අයත් ඉඩම ද, නැගෙනහිරට : එස්. පී. ජයරත්නට අයත් ඉඩම ද, දකුණට : එල්. සෝමරත්නට අයත් ඉඩම ද, බස්නාහිරට : ගෝනහේන පාර (මහා මාර්ගය) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 353/295හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර, බැලුම්මහර,
මුදුන්ගොඩ.

12-584

---

## මහජන බැංකුව - පමුණුගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.08.18 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2003.10.03 දිනැති අංක 8483 සහ 2003.10.03 දිනැති අංක 8484 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, කඳමුල්ල ආරච්චිගේ ජෝෂප් අශෝක ප්‍රියංකර පීරිස් සහ කඳමුල්ල ආරච්චිගේ ජෙරාඩ් රේමන්ඩ් පීරිස් *නොහොත්* කඳමුල්ල ආරච්චිගේ ජෙරල්ඩ් රේමන්ඩ් පීරිස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ තිස්දෙදහස් දෙසීය (රු. 1,32,200) සහ රුපියල් දෙලක්ෂ දොලොස්දහස් එකසියඅටයි ශත දෙකක (රු. 2,12,108.02) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.08.31 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එක්ලක්ෂ තිස්දෙදහස් දෙසීය (රු. 1,32,200) සහ 2005.09.11 දින සිට වාර්ෂිකව 19% බැගින් රුපියල් දෙලක්ෂ දොලොස්දහස් එකසිය අටයි ශත දෙක (රු. 2,12,108.02) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ තිස්දෙදහස් දෙසීය (රු. 1,32,200) සහ රුපියල් දෙලක්ෂ දොලොස්දහස් එකසිය අටයි ශත දෙක (රු. 2,12,108.02) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 8483 සහ 8484 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, පමුණුගම පිහිටි හොරඑළදළුපොත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. පියදාස විසින් 1999.10.20 වැනි දින මැන සකස් කළ අංක 484/8/99 දරන පිඹුරේ ලොට් අංක 'ඒ' දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක පීපී/ගම්/600හි කැබලි අංක 17 සහ 18 ද, නැගෙනහිරට : ලොට් සී ද, දකුණට : ලොට් සී ද, බස්නාහිරට : හැමිල්ටන් ඇලට මායිම්ව ඇති පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විසිතුනයි දශම තුනයි හත (අ. 0, රූ. 1, පර්. 23.37) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 432/36හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී හොරඑළදළුපොත නැමැති ඉඩමට සාදන ලද ඉහත කී අංක 484/8/99 දරන පිඹුරේ ලොට් අංක 'බී' දරන කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ලොට් සී ද, දකුණට : පැන්ටලින් රූදිගුට අයත් ඉඩම සහ අංක පීපී/ගම්/600 දරන පිඹුරේ ලොට් 37 ද, බස්නාහිරට : හැමිල්ටන් ඇලට මායිම්ව ඇති පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විසිතුනයි දශම තුනයි හත (අ. 0, රූ. 1, පර්. 23.37) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 432/37හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ප්‍රාදේශීය කළමණාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

12-582

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2005.06.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මයා විසින් සහතික කරන ලද 2002.12.04 දිනැති අංක 2502 දරන උකස්කරය මත මුල් මුදල් හා 2005.02.19 දින තෙක් පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් දෙසිය විසි අටයි ශත දොළහක (රු. 3,62,228.12) මුදල සමඟ රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් හාරසිය හැටතුනයි ශත අනූඑකක (රු. 3,24,463.91) මුදල මත 2005.02.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතක (17%) වාර්ෂික පොලියක් ද, රජවැල්ල,

දිගන, අඹසෙවනගම, අංක 50 දරන ස්ථානයේ පදිංචි කාන්ති මෙත්තානන්ද මිය යන අයගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2002.12.04 දිනැති අංක 2502 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් දෙසිය විසි අටයි ශත දොළහක (රු. 3,62,228.12) මුදල සමඟ 2005.02.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු අඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 26 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කළුගම්මනසිය පත්තුවේ, බරිගම හි පිහිටි, බලයලත් මිනින්දෝරු තැන වන බර්නාඩ් පී. රූපසිංහ මයා විසින් සාදන ලද 1993 ඔක්තෝබර් මස 14, 15, 20 හා 30 දිනයන්හි අංක 1162 දරන පිඹුරේ කැබලි අංක 49 යනුවෙන් පෙන්නුම් කර ඇති හෙට්ටියාවත්ත හෙවත් රිච් ග්‍රෝව් යැයි හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක් වන, උතුරු-නැගෙනහිරට : කැබලි 37 යනුවෙන් පෙන්නුම් කර ඇති පාර සඳහා වූ වෙන් කිරීම ද, නැගෙනහිරට : යහලතැන්න වත්ත ද, දකුණට : යහලතැන්න වත්ත ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ කැබලි 4 ද මායිම් වූ, පර්චස් විසිපහයි දශම හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 25.70) වපසරියෙන් යුත් ත්‍රිකෝනාකාර හැඩයකින් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති වගාවන්, කැබලි 19, 37 හා 38 යන්නෙන් පෙන්නුම් කර ඇති පාර ප්‍රවේශය පාවිච්චි කිරීමේ අයිතිය හා කැබලි 50 යනුවෙන් පෙන්නුම් කර ඇති ළිඳ පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 593/08 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. යූ. බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණී ශාඛාව,
මහනුවර.

12-585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.